සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# ඉතිහාසය

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට වරහන තුළ දී ඇති වචන වලින් හිස්තැන් පුරවන්න.

01 අතීත ජන සමාජය සත්ව පාලනයේ දී ගවයාගෙන් පෝෂක ද්‍රව්‍ය .............................. ලබාගෙන ඇත. (පහක් / තුනක් / දෙකක් )

02 අතීත විදේශ වෙළඳාම් කටයුතු වලදී .................................... ආශ්‍රිතව කටයුතු කළ නිළධාරීන් රේගු නිළධාරින් ලෙස හඳුන්වා ඇත. (ගොවිතැන / වරාය / ගම්පාලනය)

03 I වන සේන රජු විසින් ........................................ නම් පාණ්ඩ්‍ය රජුගේ ආක්‍රමණය පරාජයට පත් කරන ලදී. (ශ්‍රීමාර ශ්‍රී වල්ලභ / රාජරාජ / රාජේන්ද්‍ර)

04 චෝළ රාජ්‍යයේ අගනුවර වර්තමානයේ දී .................................. නමින් හඳුන්වනු ලැබේ. (මදුරාපුරය / කාංචිපුරය / තන්ජෝරය)

05 අතුරුදහන්ව පැවති නගරයක් වීම හා පැරණි නගර නිර්මාණයට සාක්ෂියක් වීම යන නිර්ණායක මත යුනෙස්කෝ සංවිධානය විසින් ................................ නගරය ලෝක උරුම ලැයිස්තුවට නම් කරන ලදී. ( මොහොන්ජදාරෝ / ලෝතාල් / කලිබන්ගන්)

- අංක 6 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 මහසෙන් රජතුමා වාරිකර්මාන්තයට කළ විශිෂ්ට සේවය නිසා මින්නේරි දෙවියන් යන නමින් ප්‍රසිද්ධ විය. ( )

07 I වන විජයබාහු රජතුමාගේ ළමා කාලය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති හොඳම මූලාශ්‍රය පනාකඩුව තඹ සන්නසයි. ( )

08 බුලත් අතක් දී වැඩිහිටියන්ට වැඳීම ස්පෘශ්‍ය උරුමයකි. ( )

09 ඇඳ ඇති සිතුවම් වල විශිෂ්ටත්වය නිසා දඹුලු විහාරය ලෝක උරුම ලැයිස්තුවට ඇතුලත් කර ඇත. ( )

10 වන්නි නායකයකු ලෙස ප්‍රසිද්ධ වූ 3 වන විජයබාහු රජතුමා දඹදෙණි රාජධානිය පිහිටුවීය. ( )



EXAMRESULTS.LK

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 අතීත කර්මාන්ත වල දි රෙදිපිළි නිෂ්පාදනය හා සම්බන්ධ ශිල්පීන් හැඳින්වූයේ කුමන නමින් ද?

(1) පෙහෙකාර (2) කුම්බකාර (3) මණිකර (4) තඹකර

12 අනුරපුර රාජධානි යුගයේ දී පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කළ මානවම්ම පෙළපතට අයත් රජු වන්නේ මින් කවරෙක් ද?

(1) I සේන (2) මාන කුමරු (3) II සේන (4) දාඨෝපතිස්ස

13 I පැරකුම් රජතුමා දක්ෂිණ දේශයේ ඉදිකළ නගරයක් වන්නේ මින් කුමක් ද?

(1) ජනනාථපුර (2) විජයරාජ පුර (3) පරාක්‍රම පුරය (4) ගඟසිරි පුරය

14 පළමු පරාක්‍රමබාහු රජුගේ බුරුම ආක්‍රමණය පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය තෝරන්න.

(1) දෙවනගල (2) පනාකඩුව තඹ සන්නස

(3) අඹගමුව සෙල්ලිපිය (4) වල්ලිපුරම් රන්පත

15 මිනිපේ ගංදෙනිය පර්වතයේ බලකොටුවක් ඉදිකර කාලිංග මාඝ දකුණට ඒම වැළැක්වීමට දායක වූ ප්‍රාදේශීය පාලකයා වන්නේ කවුරුන් ද?

(1) සුභසෙන්පති (2) බුවනෙකබා ආදිපාද

(3) සංඛ සෙන්පති (4) 3 වන විජයබා රජුය

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර දි ඇති හිස්තැනෙහි ලියන්න.**

16 පැරණි ගොවියෝ කුඹුරු ගොවිතැනේ දී තෙල් පෙඟවූ පහන් තිර දල්වන ලද්දේ ...................................... උවදුරෙන් වගාව ආරක්ෂා කර ගැනීම සඳහාය.

17 අනුරපුර යුගයේ මුල්කාලයේ ගම පාලනය කළ තැනැත්තා ............................................... ලෙස හඳුන්වා ඇත.

18 නිශ්ශංකමල්ල රජු තම රජ පවුලේ සාමාජිකයන්ගේ බරට සමාන ලෙස ......................................... දාන දෙන ලදී.

19 මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සීගිරි උද්‍යානය .................................................... වනය ලෙස නම් කළේය.


20 දඹදෙණි යුගයේ දී පොළොන්නරුවේ බලවත්ව සිටි ............................................ පරාජයට පත් කළ II පැරකුම් රජු ශ්‍රී ලංකාවේ රජරට ප්‍රදේශය විදේශ ආධිපත්‍යයෙන් මුදවා ගන්නා ලදී.

.

(20 x 2 = 40)

**07 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.





01. (i) ශ්‍රී ලංකාවේ අනුරපුර යුගයට අයත් පාලකයෙක් වන II වන සේන රජු විසින් ආක්‍රමණය කළ රාජ්‍යය A අක්ෂරයෙන් දැක්වේ. එම රාජ්‍යය කුමක් ද? (ල. 02)

A .............................................................................................

(ii) තාන්ජෝරය අගනුවර කරගත් දකුණු ඉන්දීය රාජ්‍යය C අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද? (ල. 02)

C .............................................................................................




(iii) ලංකා සිතියමේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ යාපහුව බලකොටුවයි. එය පිහිටුවාගත් සෙනෙවියා කවුද? (ල. 02)

i. .............................................................................................

(iv) B අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු රුහුණේ පිහිටුවා ගත් ස්වාධීන පාලන මධ්‍යස්ථානයකි. එය කුමක් ද?(ල. 02)

C



(v) C පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද? (ල. 02)

(vi) මෙහි සඳහන් වන ආකාරයට I විජයබාහු රජුට උදව් කළ සෙන්පතිවරයා කවුද? (ල. 02)

D



(vii) D පින්තූරයේ දැක්වෙන්නේ කාශ්‍යප රජු විසින් ඉදිකළ බලකොටු රාජධානියකි. එය කුමක් ද? (ල. 02)

(viii) මෙය ලෝක උරුමයක් බවට පත් කිරීමට බලපෑ හේතු දෙකක් දක්වන්න. (ල. 02)

02. (i) පළමු වන විජයබාහු පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) පහත සඳහන් වන්නේ පොළොන්නරු යුගයේ රජවරුන් විසින් කරන ලද කාර්යයන් කීපයකි. එයින් පළමුවන පැරකුම් රජු විසින් ඉටු කරන ලද කාර්යන් 04ක් තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂර ලියන්න.

A - රුහුණේ කේශධාතු කාශ්‍යප පරාජය කර කතරගම මුල් කරගෙන රජ වීම.

B - පොළොන්නරු කතිකාවත පිහිටුවීම

C - ඈපා මාපා තනතුරු ඇතිකර සම්ප්‍රදායික පරිපාලන රටාව නැවත ස්ථාපිත කිරීම.

D - දෙවන මානාභරණට එරෙහිව දෙවන ගජබා රජු සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම.

E - බුද්ධරාජ නම් සෙන්පතියකුගේ උදව් ලබා ගැනීම.

F - සුගලා බිසව සමග සටන් වැදීම.

G - පස්දුන් කෝරළය සංවර්ධනය කිරීම. (ල. 04)

(iii) අවංක භාවය හා කළගුණ සැලකීම පළමුවන විජයබා චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකකි. මෙය උදාහරණ 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 04)

03. (i) පහත සඳහන් සෙනෙවිවරුන් පොළොන්නරු යුගයේ රජකළ ඇතැම් රජවරුන්ට උදව් කළේ කුමන කාර්යයන් සම්බන්ධයෙන් දැයි දක්වන්න.

(1) සිත්නරුබිම්බුදල්නා ..............................

(2) නගරගිරිකීර්ති ..............................

(3) ලංකාපුරසෙනවි .............................. (ල. 03)

(ii) පහත සඳහන් වන්නේ පොළොන්නරු යුගයේ රජවරුන් කිහිපදෙනෙකු විසින් ඉටුකරන ලද ශාසනික සේවා කීපයකි. ඒවා අතරින් පළමුවන විජයබා රජු විසින් සිදුකළ සේවාවන් 04 ක් තෝරා ලියන්න.

A - තුන්නිකාය සමගි කරවීම

B - බුරුම රටින් භික්ෂූන් ගෙන්වා උපසම්පදාව ඇතිකිරීම

C - පොළොන්නරු කතිකාවත පිහිටුවීම

D - පොළොන්නරුවේ තෙමහල් දළදා මාලිගයක් ඉදිකිරීම

E - පොළොන්නරුවේ කිරිවෙහෙර ඉදිකිරීම

F - ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය පිළිසකර කිරීම

G - පොළොන්නරුවේ පබළු වෙහෙර කරවීම

H - අනුරපුරයේ හා රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම (ල. 04)

(iii) නිශ්ශංක මල්ල රජතුමා විදේශ රාජවංශයක පාලකයකු ලෙස ශ්‍රී ලංකාවේ දී විවිධ අභියෝග වලට මුහුණ දෙමින් ජනතා ශුභසාධන කටයුතු වලට දායකත්වය ලබා දී ඇත. එතුමා ජනතා ශුභසාධනයට කරන ලද කාර්යයන් 04 ක් නම් කර පැහැදිලි කරන්න. (ල. 04)

04. (i) පහත සඳහන් සංස්කෘතික උරුම අතරින් අස්පෘශ උරුම 03 ක් තෝරා නම් කරන්න.

වැව්, ජනශ්‍රැති, ඇදහිලි හා විශ්වාස, පොකුණු, විවිධ කලා නිර්මාණ, ඇළවේලි, පැරණි පොත්පත්. ජන ගීත, බලකොටු, රජ මාලිගා (ල. 03)

(ii) පහත සඳහන් නිර්ණායකයන්ට අදාළව යුනෙස්කෝ සංවිධානය ලෝක උරුම ලෙස නම් කළ ස්ථාන එම නිර්ණායකය ඉදිරියෙන් ලියා දක්වන්න.

| | නිර්ණායකය | ලෝක උරුමය |
|---|---|---|
| A | අතීත ආරක්ෂක පවුරක් ලෙස නම් කළ ලෝක උරුමය | .............................. |
| B | නිර්මාණවල ඓතිහාසික වැදගත්කම හා සංස්කෘතිකමය වටිනාකම සලකා ලෝක උරුම ලෙස නම් කළ ශ්‍රී ලංකාවේ පළමු රාජධානිය. | .............................. |
| C | අති විශිෂ්ට නිර්මාණ නිසා ලෝක උරුම බවට පත් පළමු විජයබාහු රජුගේ පාලන මධ්‍යස්ථානය | .............................. |
| D | පෘතුගීසින් විසින් කුඩාවට ඉදිකරණ ලදුව ලන්දේසින් විසින් ආරක්ෂක බලකොටුවක් ලෙස ඉදිකරන ලද පෞරාණික ඉදිකිරීම් නිසා ලෝක උරුමයක් බවට පත් ඉදිකිරීම් | .............................. |

(ල. 04)

(iii) සීගිරිය බලකොටුවක් මෙන්ම කාලගාරයක් සීගිරියේ ඇති විවිධ නිර්මාණ ඇසුරින් එය පැහැදිලි කරන්න. (ල. 04)

05. (i) අතීතයේ අපේ සංස්කෘතිය හා බැඳුන උසස් රංග කලාවක් සහිතව අතීත රජවරු උත්සව පැවැත් වූ ආකාරය පිළිබඳව මහාවංශයේ සඳහන් කතා පුවත් 03 ක් ඇසුරින් වගුව පුරවන්න. (ල. 03)

| රජතුමා | රංගනයන් සහිතව පැවැත්වූ උත්සවය |
|---|---|
| දුටුගැමුණු | ................................................................ |
| I පැරකුම් | ................................................................ |
| II පැරකුම් | ................................................................ |

(ii) ඉන්දියානු ආභාෂයෙන් අප විසින් පවත්වාගන යන උත්සව කිහිපයක් පහතින් දක්වේ. ඒවා හඳුන්වන්න.

A නාම කරණ ................................................................

B කර්ණ වේදන ................................................................

C අන්ත ප්‍රාශන ................................................................

D විද්‍යාරම්භ ................................................................

(ල. 04)

(iii) මෙරට සාම්ප්‍රදායක කලා ශිල්ප පිළිබඳ අතීත දැනුම වර්තමාන කලා නිර්මාණ වලට යොදාගෙන ඇති ආකාරය පින්තූර වලින් දක්වේ. එම පින්තූර වලට අදාළ සාම්ප්‍රදායික කර්මාන්ත මොනවාදැයි ඉදිරියෙන් ලියන්න.

| | |
|---|---|
|  | A ........................................ |
|  | B ........................................ |
|  | C ........................................ |
|  | D ........................................ |

(ල. 04)

06. (i) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී අතීත අත්දැකීම් තුළින් බිහි වූ සාම්ප්‍රදායික දැනුම් සම්භාරයක් අපට උරුම ලෙස ලැබී ඇත. එලෙස කෘෂිකර්මාන්තයෙන් අපට ලැබුණ සාම්ප්‍රදායික දැනුම් ක්ෂේත්‍ර 3 ක් වරහන් තුළින් තෝරා ලියන්න.

(වැව් තැනීම, අකුරුකියවීම, සොරොව් තැනීම, හිස් වැසුම් ගැලවීම, භෝග වැපිරීම) (ල.03)

(ii) අප රට පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම සඳහා අපගේ අතීත මුතුන්මිත්තන්ගෙන් ලබාගත හැකි හැකියාවන් 04 ක් ලියන්න. (ල. 04)

(iii) අපගේ සංස්කෘතික උරුමයන් රැකගැනීමේ ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 04)

07. (i) 3 වන විජයබාහු රජතුමා දඹදෙනිය අගනුවර කරගත් අවධියේ ලංකාව බෙදී පැවති පරිපාලන කොට්ඨාස නම් කරන්න. (ල. 03)

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(ii) පහත දක්වා ඇති උපකාරක පද උදව් කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

(1) දක්ෂිණ දේශයට භාවිතා වන තවත් නමක් ලියන්න.

(2) රුහුණේ ගෝවින්ද මලය ප්‍රදේශයේ බලකොටුවක් පිහිටුවාගත් ප්‍රාදේශිය පාලකයා.

(3) දඹදෙණිය යුගයේ ලංකාව ආක්‍රමණය කළ ජාවක රජුතමා

(4) II විජයබාහු රජතුමා විසින් කාලිංග මාඝගෙන් දළදා වහන්සේ ආරක්ෂා කර ගැනීම සඳහා දළදා මාළිගයක් ඉදිකළ ස්ථානය.


පහළට

(5) සුභ සෙන්පති බලකොටුවක් පිහිට වූ ස්ථානය

(6) දෙවන පැරකුම් රජු විසින් රචනා කරන ලද කෘතියකි

(7) කාලිංඝ මාඝිම්ගේ ආක්‍රමණය නිසා කොත්මලයට වැඩම කර භික්ෂූන් වහන්සේලා විසින් ආරක්ෂාව සැලසූ පූජනීය වස්තුවකි.

(8) සංඛ සෙනෙවි විසින් බලකොටුවක් පිහිටුවා ගත් ස්ථානයකි.




(ල. 08)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. පහක් 02. වරාය 03. ශ්‍රීමාර ශ්‍රී වල්ලභ 04. තන්ජෝරය 05. මොහොන්ජදාරෝ 06. ( ✓ ) 07. ( ✓ )
08. ( ✗ ) 09. ( ✓ ) 10. ( ✓ ) 11. ( i ) 12. II සේන 13. I වන පැරකුම් 14. දෙවනගල සෙල්ලිපිය
15. සංඛ සෙන්පති 16. මැස්සන් මර්ධනය කර 17. ගමික 18. තුලාභාර 19. ප්‍රමද 20. කාලිංග මාඝ

(2 x 20 = ල. 40)

## II කොටස

01. (i) A - පාණ්ඩ්‍ය (ii) C - චෝළ (iii) A - සුභ සෙන්පතියා (iv) B - ගෝවින්ද මලය බලකොටුව
(v) පනාකඩුව තඹ සන්නස (vi) සිත්නරුබිම් බුදල්නා (vii) සීගිරිය
(viii) කලාගාරයක්, ආරක්ෂිත බලකොටුවක්, රජමාලිගයක් යන කරුණු මුල් කරගෙන (ල. 02 × 8 = 16)

02. (i) ⋆ මහාවංශය ⋆ අඹගමු සෙල්ලිපිය ⋆ පනාකඩු ගඹ සන්නස (ල. 03)
(ii) B, D, F, G (ල. 04)
(iii) අවංකකම - රජකමට පත්වීමෙන් පසුව ද මේ කුඩා කාලයේ විඳි දුක් තම වචනයෙන් කියා තිබීම. එතුමාගේ අවංකකම කියා පාන්නකි.
කෘතගුණ සැලකීමේ ගුණය - කුඩා කල තමාට උදව් කළ බුදල්නාවන්ට වර ප්‍රසාද ලබා දීම
නොපසුබස්නා උත්සාහය - චෝළයන් සමඟ කළ සටන් වලදී අවස්ථා කීපයක් පරාජයට පත් වුවද තම දුර්වලතා හඳුනාගෙන ඉදිරියට සටන් මෙහෙයවා රට බේරා ගැනීම. (ල. 04)

03. (i) • සිත්නරුබිම් බුදල්නා - සොළීන් එළවා දැමීමට පළමු විජයබා රජුට උදව් වීම.
• නගරගිරි කීර්ති - I වන පැරකුම්ට බුරුමය ආක්‍රමණය කිරීමට
• ලංකාපුර සෙනෙවි - I වන පැරකුම්ට පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීමට (ල. 03)
(ii) B, D, F, H (ල. 04)
(iii) ⋆ තුලාභාර දාන දීම ⋆ සොර සතුරු බිය නැති කිරීම ⋆ දිළින්දන්ට සැලකීම
⋆ බදු සහන ලබා දීම (ල. 04)

04. (i) • ජනශ්‍රැති • ඇදහිලි හා විශ්වාස • ජනගීත (ල. 03)
(ii) A - චීන මහා ප්‍රාකාරය B - පැරණි අනුරපුර නගරය C - පැරණි පොළොන්නරු නගරය
D - ගාලු කොටුව (ල. 04)
(iii) ආරක්ෂිත බලකොටුවක් - පවුරු ප්‍රකාර, දියඅගල් නිර්මාණය කර තිබීම.
කලාගාරයක් - සීගිරි සිතුවම්, කැටපත් පවුරේ කුරුටු ගී ආදිය නිර්මාණය කර තිබීම නිසා (ල. 04)

05. (i) දුටු ගැමුණු රජතුමා - රුවන් වැලි සෑයට මුල්ගල තැබීමේ උත්සවයට දිව්‍ය කාන්තාවන් සමාන නාටිකාවන්ගනාවන් පිරිවරාගෙන .......... තූර්ය වාදන සහිතව .................
I පැරකුම් - නැටුම් ගැයුම් පැවැත්වීමට ගොඩනැගිලි ඉදිකිරීම එතුමාගේ රූපවතී බිසව නැටුම් ගැයුම් සඳහා දක්ෂ කාන්තාවක් වීම.
II පැරකුම් - නානාප්‍රකාර නැටුමෙන් හා මධුර ගිතිකාවෙන් යුත් උත්සවයන් පැවැත්වූ බව මහාවංශයේ සඳහන් විම (ල. 03)
(ii) නාමකරණ - නම් තැබීම කර්ණවේදන - කන් විදීම
අන්ත ප්‍රාශාන - අඳුල් කට ගෑම විද්‍යාරම්භ - අකුරු කියවීම ( අධ්‍යාපනය ඇරඹීම) (ල. 04)
(iii) A - පැදුරු විවීම B - පිත්තල කැටයම් C - වෙස්මුහුණු නිර්මාණය D - ලාක්ෂා කර්මාන්තය (ල. 04)

06. (i) ⋆ වැව් තැනීම ⋆ සොරොව් තැනීම ⋆ භෝග වැපිරීම (ල. 03)
(ii) • නිර්මාණශීලී භාවය • කලාත්මකභාවය • ඉංජිනේරුශිල්පය • තාක්ෂණය (ල. 04)
(iii) • අතීත නිර්මාණ පිළිබඳව මුතුන් මිත්තන් තුළ වූ දැනුම පමණක් නොව ඒවා රැකගැනීම පිළිබඳව උවනුි සතු වූ ආකල්ප දැන ගැනීමට
• ලෝකය හමුවේ අපේ සංස්කෘතිය පිළිබඳ අභිමානය පෙන්වීමට
• සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට
• අතීත මුතුන්මිත්තන් රැකගත් දේ අපද රැක ගෙන අනාගත පරපුරට දායාද කිරීමට. (ල. 04)

07. (i) රුහුණු, පිහිටි, මායා (ල. 03)
(ii)

| හරහට | පහළට |
|---|---|
| 1. මායාරට | 5. යාපහුව |
| 2. බුවනෙකබා ආදිකතුවරයා | 6. කවිසිළුමිණ |
| 3. චන්ද්‍රබාහු | 7. දන්තධාතුව |
| 4. බෙලිගල | 8. ගංදෙණිය |

(ල. 08)